සැ. යු. - 2019.11.22 වැනි දින පළවූ අංක 2151 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,152 - 2019 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා - 2019.11.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 2872 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 2875 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | 2877 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 2878 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 2878 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 2880 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


***සැ. යු.*** - (i) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2019 නොවැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2019 නොවැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 දෙසැම්බර් මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 දෙසැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2871 – B 081582 — 403 (2019/11)
A 1-

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2019 අංක 928

MOD//DEF/HRM/SLN/CON/7/2254.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

*2017 ජූලි මස 25 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාන්ඩර්] බැමිණහැන්නදිගේ දුමින්ද ප්‍රියදර්ශණ පීරිස්, එන්ආර්එක්ස් 2254, ශ්‍රීලංනාහ

*2019 සැප්තැම්බර් මස 17 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) [තාවකාලික ලුතිනන් කොමාන්ඩර් (සැ)] වීරසූරිය ආරච්චිගේ කැලුම් සම්පත් විරසුරිය, එන්ආර්එස් 2667, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

11 - 1653/1

---

2019 අංක 929

MOD//DEF/HRM/SLN/PRO/7/5515.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2019 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) වශයෙන් :*

ලුතිනන් (ස්වේ) අනුරාධ ජයසිංහ, එන්වීකිව් 5515, ශ්‍රීලංස්වේනාහ
ලුතිනන් (ස්වේ) කොහොඹගහ ගෙදර සුනිල් ප්‍රියදර්ශන විජේරත්න, එන්වීකිව් 5516, ශ්‍රීලංස්වේනාහ
ලුතිනන් (ස්වේ) චමිලා චූලානී ඩයමන්තිනා දුමින්ගු විතානගේ එන්වීකිව් 5519, ශ්‍රීලංස්වේනාහ

*2019 සැප්තැම්බර් මස 12 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) වශයෙන් :*

ලුතිනන් (ස්වේ) රන්කොත් පේඩිලාගේ ලලිත් ප්‍රසන්න සේනාරත්න, එන්වීඑක්ස් 5531, ශ්‍රීලංස්වේනාහ
ලුතිනන් (ස්වේ) සේතුංග මුදියන්සේලාගේ සසංක ප්‍රසාද් ජයවර්ධන, එන්වීඑක්ස් 5545, ශ්‍රීලංස්වේනාහ
ලුතිනන් (ස්වේ) හටනා දේවගේ ඉසුරු සමන් ගෝණමඩවත්ත, එන්වීඑක්ස් 5546, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

11 - 1653/2

---

2019 අංක 930

MOD//DEF/HRM/SLN/PRO/7/2707.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2019 මාර්තු මස 07 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (පනිසෞ) වශයෙන් :*

ලුතිනන් (පනිසෞ), කුලතුංගගේ ජයලත් සමින්ද කුලතුංග, එන්ආර්ඩබ් 2707, ශ්‍රීලංනාහ

*2019 සැප්තැම්බර් මස 02 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :*

ලුතිනන් (වි), කඹුරාවල විතානගේ චමින් මධුෂ කුමාර විතානගේ, එන්ආර්එල් 2766, ශ්‍රීලංනාහ

*2019 සැප්තැම්බර් මස 07 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් ජයසේකර මුදියන්සේලාගේ හර්ෂ ඉදුනිල් බන්ඩාර, එන්ආර්එක්ස් 2998. ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

11 - 1653/3

---

2019 අංක 931

MOD//DEF/HRM/SLN/PRO/7/2717.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2019 මාර්තු මස 07 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ), ජයනෙත්තිලාගේ නිමල් ජයනෙත්ති, එන්ආර්එස් 2717, ශ්‍රීලංනාහ

*2019 සැප්තැම්බර් මස 23 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් තෙන්නකොන් මුදියන්සේලාගේ තණකොටුවේ ගෙදර ධම්මික නිශාන්ත කුමාර, එන්ආර්එක්ස් 2732, ශ්‍රීලංනාහ

*2019 සැප්තැම්බර් මස 30 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් ලියනගේ යෝමාල් සුජිත් වීරසිංහ, එන්ආර්එක්ස් 2734, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

11 - 1653/4

2019 අංක 932

MOD//DEF/HRM/SLN/PRO/7/2993.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2019 අගෝස්තු මස 31 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන්, වනිගසේකර මුදියන්සේලාගේ චින්තක ප්‍රසාද් වනිගසේකර, එන්ආර්එක්ස් 2993, ශ්‍රීලංනාහ

*2019 සැප්තැම්බර් මස 07 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන්, කුලසිංහගේ දසත ප්‍රසන්න කුලසිංහ, එන්ආර්එක්ස් 2995, ශ්‍රීලංනාහ

ලුතිනන්, හේවාවසම් හග්ගල්ලගේ අසංග චමීර හේවාවසම්, එන්ආර්එක්ස් 2997, ශ්‍රීලංනාහ

ලුතිනන්, තරින්ද දක්ෂිත අධිරාජ් විජේවර්ධන, එන්ආර්එක්ස් 3002, ශ්‍රීලංනාහ

ලුතිනන්, නලින් චමින්ද කරුණාරත්න, එන්ආර්එක්ස් 3005, ශ්‍රීලංනාහ

ලුතිනන්, තිලදුරේ වියන්තලාගේ චින්තක සමන්ත, එන්ආර්එක්ස් 3008, ශ්‍රීලංනාහ

*2019 සැප්තැම්බර් මස 09 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :*

ලුතිනන් (වි), දහනායක විතානගේ නුවන් බුද්ධික, එන්ආර්එල් 2768, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

11 - 1653/5

2019 අංක 933

MOD//DEF/HRM/SLN/PRO/7/2775.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2019 සැප්තැම්බර් මස 09 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිනන් (නාසෙ), හෙට්ටි ආරච්චිගේ සාගර තරංග පෙරේරා. එන්ආර්පී 2775, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

11 - 1653/6

---

2019 අංක 934

MOD/DEF/HRM/05/SLAF/RET/253.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2020 ජනවාරි මස 12 වන දින සිට බල පැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එයාර් කොමොඩෝර් ඉන්දික කමල් වීරරත්න (01611) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

11 - 1618

---

2019 අංක 935

MOD/DEF/HRM/05/SLAF/RET/250.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2020 ජනවාරි මස 02 වන දින සිට බල පැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

විංග් කමාන්ඩර් වල්ලගොඩ ආරච්චිගේ ඉන්දික වර්ණප්‍රිය (02211) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

11 - 1651

---

2019 අංක 936

MOD/DEF/HRM/05/SLAF/RET/251.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2020 ජනවාරි මස 31 වන දින සිට බල පැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

විංග් කමාන්ඩර් පරගහ වත්තගේ ප්‍රිමාල් (02310) - විනයාරක්ෂක

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

11 - 1650

2019 අංක 937

MOD/DEF/HRM/05/SLAF/C OB/03.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
ශාඛාව මාරු කිරීම්

2019 සැප්තැම්බර් මස 23 වන දින සිට බල පැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා විද්‍යුත් ඉන්ජිනේරු ශාඛාවේ සිට තොරතුරු තාක්ෂණ ඉන්ජිනේරු ශාඛාවට මාරු කොට ඇත.

ස්ථිර විංග් කමාන්ඩර් සූරියආරච්චි කංකානමලාගේ හිරාන් චානක සූරිය ආරච්චි (02307) විද්‍යුත් ඉන්ජිනේරු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ජෙනරාල් එස් එච් එස් කෝට්ටේගොඩ (විශ්‍රා),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

11 - 1652

---

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2019 අංක 938

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ සුජීව නිශාන්ත අකුරන්තිලක මහතා 2018 ජූලි මස 13 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරට පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2019 නොවැම්බර් මස 14 වැනි දින දී ය.

11 - 1694/1

---

2019 අංක 939

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I පන්තියේ ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක මහතා 2019 පෙබරවාරි මස 01 වැනි දින සිට

ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් තනතුරෙහි වැඩබැලීම සඳහා පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2019 නොවැම්බර් මස 14 වැනි දින දී ය.

11 - 1694/2

---

2019 අංක 940

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විශේෂ ශ්‍රේණියේ එන්. ආර්. අනීස් මහත්මිය 2019 පෙබරවාරි මස 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2019 නොවැම්බර් මස 14 වැනි දින දී ය.

11 - 1694/3

---

2019 අංක 941

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එච්. ජී. සුමනසිංහ මහතා සිය නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව, 2019 මාර්තු මස 07 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2019 නොවැම්බර් මස 14 වැනි දින දී ය.

11 - 1694/4

2019 අංක 942

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් කේ. ඩී. එම්. සිල්වා මහතා 2019 ජූනි මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2019 නොවැම්බර් මස 14 වැනි දින දී ය.

11 - 1694/5

---

2019 අංක 943

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ පී. එම්. එච්. ප්‍රියදර්ශනී මහත්මිය 2019 අගෝස්තු මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, නැවත නියමයක් කරනතුරු හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් තනතුරට පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2019 නොවැම්බර් මස 14 වැනි දින දී ය.

11 - 1694/6

---

2019 අංක 944

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය

විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුවින්ද සමරකෝන් සිංගප්පුලි මහතා 2019 අගෝස්තු මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, නැවත නියමයක් කරනතුරු සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් තනතුරට පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2019 නොවැම්බර් මස 14 වැනි දින දී ය.

11 - 1694/7

---

2019 අංක 945

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ඒ. ජී. නිමල් කරුණාතිලක මහතා 2019 සැප්තැම්බර් මස 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, නැවත නියමයක් කරනතුරු වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2019 නොවැම්බර් මස 14 වැනි දින දී ය.

11 - 1694/8

---

# අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

2018 ජූලි මස 13 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2080 දරන *ගැසට් පත්‍රයේ* 2018 අංක 642 හා 07-264 යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පළකරන ලද *ගැසට්* නිවේදනය 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කොට බලරහිත කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

එච්. සංජීව සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2019 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ 12.
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

11 - 1531

## වෙනත් පත්කිරීම් ආදිය

සංශෝධනයයි

DVF/RECT/143 (V)/AY..

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම් හා පොදු උප සේවයට මාරු කිරීම

**අධිකාරියට පත් කිරීම් හා පොදු උප සේවයට මාරු කිරීම**

2016.05.20 වැනි දින පළකරන ලද අංක 1968 දරන ගැසට් පත්‍රයේ නිවේදන අංක 05/454 හා 2016 අංක 322 නිවේදනයේ

කෙඩෙට් නිලධාරී රත්නායක මුදියන්සේලාගේ උදිත අනුරාධ රත්නායක - කපිතන් - 2014.07.21 ලෙස පළවී ඇත.

එය ලුතිනන් රත්නායක මුදියන්සේලාගේ උදිත අනුරාධ රත්නායක (සී/33792) (නි/10613) 2014.07.21 ලෙස සංශෝධනය විය යුතුය.

කේ ලියනගේ ආර්ඩබ්පී ආර්එස්පී,
බ්‍රිගේඩියර්,
මූලික මාණ්ඩලික නිලධාරී.
සේනාවිධායක ශ්‍රිලංයුහසෙව්බ වෙනුවට.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුද ස්වේච්ඡා බලසේනාව,
යුද්ධ හමුදා කඳවුර,
ශාලාව,
කොස්ගම.

11 - 1678

---

## රජයේ නිවේදන

**1941 අංක 39 දරන ණයසහනදායක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම්දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත, 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණය තුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25 (1) 26 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුභාෂිනි දයානන්ද මිය,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2019 නොවැම්බර් මස 06 වැනි දින,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව,
අංක 35 ඒ,
ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

| | ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියගේ නම සහ ලිපිනය | මීළඟ කැඳවීම් දිනය |
|---|---|---|---|---|
| 01. | 45226 | ලියනදුරගේ සීලවතී ජයවීර මිය, මල්ගහමුලන, කිඹීකන්ද, වදුරඹ. | ඉන්ද්‍රජිත් දීපනාත් විජේසේකර දිසානායක මයා, කොස්ගහහේන, නැහිතිගල, ඌරල, වදුරඹ. | 2020.01.08 |
| 02. | 45221 | නවරත්න මුදියන්සේලාගේ ඩිංගිරි මැණිකේ මිය, 453/3, පිටපන උතුර, හෝමාගම. | ජී. කේ. ඉන්වෙස්ට්මන්ට් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්, 136/B/1, කම්හල් පිටිය මාවත, ගලගෙදර, පාදුක්ක. | 2020.01.14 |
| 03. | 45123 | සිංගප්පුලි අච්චිගේ ප්‍රියංකා සමන්මලී පෙරේරා මිය, නො. 247, ගලවිල පාර, හෝමාගම. | මල්වඩම් ගෙදර ධර්මසිරි මයා, නො. 259, පන්සල පාර, හෝමාගම. | 2020.01.14 |
| 04. | 45072 | මොරගොඩගේ එරංගි ශශී ප්‍රභා මොරගොඩ මිය, මාහිම්පිටිය පාර, බ/දන්ඩගමුව, කුලියාපිටිය. | කෝට්ටේහේවගේ මලීෂ ෂෙනාල් ප්‍රනාන්දු මයා, ධර්මරාජගම, කනදුල්ල, කුලියාපිටිය. | 2019.11.04 |
| 05. | 45071 | මොරගොඩගේ එරංගි ශශී ප්‍රභා මොරගොඩ මිය, මාහිම්පිටිය පාර, බ/දන්ඩගමුව, කුලියාපිටිය. | කෝට්ටෙ හේවගේ මලීෂ ෂෙනාල් ප්‍රනාන්දු මයා, ධර්මරාජගම, කනදුල්ල, කුලියාපිටිය.<br><br>නිපුනච්චාරි ගණිතයලාගේ රනිල් ප්‍රදීප් පුෂ්ප කුමාර මයා, ධර්මරාජගම, කනදුල්ල, කුලියාපිටිය. | 2019.11.04 |
| 06. | 45070 | මොරගොඩගේ එරංගි ශශී ප්‍රභා මොරගොඩ මිය, මාහිම්පිටිය පාර, බ/දන්ඩගමුව, කුලියාපිටිය. | නිපුනච්චාරි ගණිතයලාගේ රනිල් ප්‍රදීප් පුෂ්ප කුමාර මයා, ධර්මරාජගම, කනදුල්ල, කුලියාපිටිය. | 2019.11.04 |

| | ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියගේ නම සහ ලිපිනය | මීළඟ කැඳවීම් දිනය |
|---|---|---|---|---|
| | | | ජයසිංහ ආරච්චිලාගේ නිලන්ත, පුෂ්ප කුමාර මයා, ධර්මරාජගම, කනදුල්ල, කුලියාපිටිය. | |
| 07. | 45237 | රේණුකා ප්‍රියදර්ශනී, මහප්පුහාමිලාගේ විලියම් මිය, නො. 68, රෝස්වුඩ් වත්ත, හපුගල, වක්වැල්ල. | නෙලුව කාරියකරණගේ සුනිල් විජයසිරි මයා, පිටමගොඩ, හිනිදුම. | 2020.02.03 |

11 - 1533

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පස්ගොඩ**

වන්දනා ගමන් ආඥාපනත

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෙරලපනාතර, ගල්බොක්ක බොදුමග සේලගිරි මහා විහාරස්ථානයේ 2020 ඇසල මහා පෙරහැර මංගල්‍ය 2020 ජනවාරි මස 08 වැනි දින සිට ජනවාරි මස 13 වැනි දින දක්වා පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥා පනතේ 175 අධිකාරිය වූ වන්දනා ගමන් ආඥා පනතේ 02 වැනි වගන්තිය අනුව 2019 මාර්තු 27 වැනි දින නිකුත් කරන ලද අංක 2126/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය යටතේ මෙයින් දන්වමි.

ටී. එච්. දර්ශන වර්ණප්‍රිය,
ප්‍රාදේශීය ලේකම්,
පස්ගොඩ.

2019 නොවැම්බර් මස 11 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

11 - 1608

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2019.08.29 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් නාඔටුන්න පල්ලියගුරුගේ චන්ද්‍රිකා මිය විසින් සහතික කරන ලද 2011 මැයි මස 11 දිනැති අංක 2562 දරන උකස් බැඳුම්කරය 2013 අගෝස්තු මස 28 දිනැති අංක 3177 දරන උකස් බැඳුම්කරය 2014 නොවැම්බර් මස 13 දිනැති අංක 3467

දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් තරින්දි කාංචනා අබේනායක විසින් සහතික කරන ලද 2016 මැයි මස 17 දිනැති අංක 80 දරන උකස් බැඳුම්කරය මත ලබාදෙන ලද ණය පහසුකම මත 2019.07.24 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් (රු. 6,244,215.13) රුපියල් හැට දෙලක්ෂ හතලිස් හතර දහස් දෙසිය පහළොවයි ශත දහතුනක මුදලක් සමඟ (රු. 5,496,938.20) රුපියල් පනස් හතර ලක්ෂ අනූහය දහස් නවසිය තිස් අටයි ශත විස්සක මුදලක් මත 16% (වසරකට සියයට දහසය) බැගින් 2019.07.25 වැනි දින සිට ගෙවීම නිමකරන දිනතෙක් තවදුරටත් පොළිය ද ගාල්ල, ගෝනමුල්ල හන්දිය, කැටෙන්දොල, මගමුලන ස්ටෝර්ස් හි දොඩම්පෙ ගමගේ ප්‍රේමරත්න මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් නාඔටුන්න පල්ලියගුරාගේ චන්ද්‍රිකා මිය විසින් සහතික කරන ලද 2011 මැයි මස 11 දිනැති අංක 2562 දරන උකස් බැඳුම්කරය 2013 අගෝස්තු මස 28 දිනැති අංක 3177 දරන උකස් බැඳුම්කරය 2014 නොවැම්බර් මස 13 දිනැති අංක 3467 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් තරින්දි කාංචනා අබේනායක විසින් සහතික කරන ලද 2016 මැයි මස 17 දිනැති අංක 80 දරන උකස් බැඳුම්කරය මත ලබාදෙන ලද ණය පහසුකම මත අයවිය යුතු (රු. 6,244,215.13) රුපියල් හැට දෙලක්ෂ හතලිස් හතර දහස් දෙසිය පහළොවයි ශත දහතුනක් සමඟ 2019.07.25 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි වියදම් හා මුදල්ද අයකර ගැනීම සඳහා ඉහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න මහතාට ද එකී ලංකා බැංකු ආඥා පනතේ 19 වැනි වගන්තිය (397 අධිකාරය) හා එහි සංශෝධන යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, ගාල්ල නගර ශාඛාවෙහි කළමනාකරුහට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන කඩවත් සතර තුළ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අක්මීමන ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 155 C කැටන්දොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කැටන්දොල හියාරේ ග්‍රාමයෙහි පිහිටි වෙවැල්හේන නමැති ඉඩමට සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද F. V. P. 655 හි ලොට් අංක 1338 හි කොටසක් ලෙස දක්වා ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ඉඩම උතුරට : ගමේ මායිම් ද, නැගෙනහිරට : සෝමසිරි වික්‍රමසිංහට අයිති ඉඩම ද, දකුණට : M. K. G. පියසේනට අයිති ඉඩම ද, බස්නාහිරට : M. K. G. ඇලිස් අප්පුහාමිට අයිති ඉඩමද මායිම්ව අක්කර එකක (අ. 0, රූ. 0, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහ කොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේත් වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO J/07/31 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු කේ. ජී. සමරසේකර විසින් සාදන ලද 2006 ජනවාරි මස 13 දිනැති අංක 1021 දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී කැටන්දොල හියාරේ ග්‍රාමයේ පිහිටි වේවැල්හේන නැමති ඉඩමෙහි අංක 1021 දරන පිඹුරෙහි ලොට් අංක A හි කොටසක් ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල ඊසාන දිශාවට : සෝමසිරි වික්‍රමසිංහ හිමිකම් කියන ඉඩම ද, ගිණිකොණට : M. K. G. පියසේන හිමිකම් කියන ඉඩම ද, නිරිතට : පාර සහ M. K. G. ඇලිස් අප්පුහාමි හිමිකම් කියන ඉඩම ද, වයඹට : පාර සහ තලගම්පොල ග්‍රාමයටද මායිම්ව එකී අංක 1021 දරන පිඹුරට අනුව අක්කර එකක (අ. 1, රූ. 0, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියළු දේත් වේ.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන කඩවත් සතර තුළ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අක්මීමන ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 155 C කැටන්දොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කැටන්දොල හියාරේ ග්‍රාමයෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් සාදන ලද අංක FVP 655 දරන පිඹුරෙහි ලොට් අංක 2198 හි කොටසක් වන මිදෙල්ලදොල නැමති ඉඩමෙහි සීමා විස්තර කොට බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2198, උතුරට : ප්‍රවේශ මාර්ගය ද, නැගෙනහිරට : D. G. තිලකරත්නගේ ඉඩම හා ප්‍රවේශ මාර්ගය ද, දකුණට : කැටෙන්දොල මහා මාර්ගය ද, බස්නාහිරට : H. G. කුමාරසිරි හා M. K. G. කරුණාතිලකගේ ඉඩම ද මායිම්ව අක්කර එකක (අ. 1, රූ. 0, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO J 07/32 හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 2198 බලයලත් මිනින්දෝරු K. G. සමරසේකර විසින් මෑතක දී මැන සාදන ලද 2000 ජුනි 11 දිනැති අංක 495 දරන මැනුම් පිඹුර අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

හියාරේ ග්‍රාමයේ පිහිටි ලොට් අංක 2198 කොටස මිදෙල්ලදොල නැමති ඉඩමේ සීමා විස්තර කොට ඇති ලොට් 2198 බෙදූ 2198B හි ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් උතුරට : ප්‍රවේශ මාර්ගය ද, නැගෙනහිරට : D. G. තිලකරත්නගේ 2198 A ඉඩම සහ ප්‍රවේශ මාර්ගය ද, දකුණට : කැටෙන්දොල මහා මාර්ගය ද, බස්නාහිරට : ලොට් 2197 සහ 2196 ද

මායිම්ව අක්කර එකක (අ.1, රූ.0, පර්.0) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති පස, ගොඩනැගිලි, ගහ කොළ, වගාවන් සහ වෙනත් සියලු දේත් වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

N. D. විදානපතිරණ මිය,
කළමනාකාරිණි.

ලංකා බැංකුව,
ගාල්ල ශාඛාව.

11 - 1689

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2019.09.04 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් D. වීරසූරිය විසින් සහතික කරන ලද 2018.10.16 දිනැති අංක 3610 දරන උකස් බැඳුම්කරය මත ලබා දෙන රු. 30,000,000.00 (රුපියල් මිලියන තිහක) කාලීන ණය මත 2019.08.16 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් (රු. 32,129,822.14) රුපියල් තුන්කෝටි විසිඑක් ලක්ෂ විසිනව දහස් අටසිය විසි දෙකයි ශත දාහතරක මුදල සමඟ එකී කාලීන ණය මුදලෙහි හිඟ හිටි මුල් මුදල වන (රු. 29,339,000.00) රුපියල් දෙකෝටි අනූතුන්ලක්ෂ තිස්නව දහසක මුදලක් මත වසරකට සියයට දහසය (16%) බැගින් 2019.08.17 වැනි දින සිට ගෙවීම නිමකරන දිනය තෙක් තවදුරටත් උපචිත විය යුතු පොළිය ද මහරගම, පමුණුව, සුරම්‍යා මාවත, අංක 43/17 C හි නමින් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 3610 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු (රු. 32,129,822.14) රුපියල් තුන්කෝටි විසිඑක් ලක්ෂ විසිනව දහස් අටසිය විසි දෙකයි ශත දාහතරක මුදල සමඟ 2019.08.17 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි වෙන්දේසිකරු වන එම්. එච්. ටී. තුසිත කරුණාරත්න මහතා වෙත එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, අගනුවර ශාඛාවේ අයකරගැනීම් සහ ණය සුපරීක්ෂණ කළමණාකරුහට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 421 ඇරැව්වල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පමුණුවෙහි පිහිටි සුචරිතෝදය පාරේ, වරිපනම් අංක 43/17C දරන තුයියවත්ත හෙවත් මිල්ලගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු අනිල් නවගමුව විසින් සාදන ලද 2016 පෙබරවාරි 17 දිනැති අංක 5683 දරන පිඹුරෙහි ලොට් B1A ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, උතුරට : D. C. කටුගම්පොල සහ වෙනත් අයට අයිති ඉඩම සහ බලයලත් මිනින්දෝරු H. G. C. ඩයස් විසින් සාදන ලද 1972 නොවැම්බර් 5 දිනැති අංක 940 දරන පිඹුරෙහි ලොට් B 6 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු H. G. C. ඩයස් විසින් සාදන ලද 940 දරන එකී පිඹුරෙහි ලොට් B 6 සහ B 5 ද, දකුණට : බලයලත් මිනින්දෝරු H. G. C. ඩයස් විසින් සාදන ලද අංක 940 දරන එකී පිඹුරෙහි ලොට් B 5 සහ B 2 සහ වසන්තිට සහ වෙනත් අයට අයිති ඉඩම ද, බස්නාහිරට : වසන්තිට සහ වෙනත් අයට අයිති ඉඩම සහ බලයලත් මිනින්දෝරු H. G. C. ඩයස් විසින් සාදන ලද අංක 940 දරන පිඹුරෙහි ලොට් B 6 ද මායිම්ව එකී අංක 5683 දරන පිඹුරට අනුව පර්චස් දාහතයි දශම පහයි බිංදුවක (අ.0, රූ.0, පර්.17.50) හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි හතරයි හතරයි තුනක (හෙක්ටයාර 0.0443) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති සියලු දේ සමඟ වේ. මෙය B472/91 වන පත්ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

ලොට් B1A ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

එකී පමුණුව පිහිටි සුචරිතෝදය පාරේ, වරිපනම් අංක 43/17 C දරන තුයියවත්ත හෙවත් මිල්ලගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු H. G. C. ඩයස් විසින් සාදන ලද 1972 නොවැම්බර් 5 (නමුත් 1972 නොවැම්බර් මස 2 ලෙස ලියාපදිංචි කර ඇති) දිනැති අංක 940 දරන පිඹුරෙහි ලොට් B1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් B1, ඊසානදිගට : ලොට් B6 ද, ගිනිකොණට : ලොට් B5 සහ B2 ද, නිරිතට : A. A. එමලින් පෙරේරාගේ දේපළ ද, වයඹට : තෝමස් පෙරේරා හිමිකම් කියන දේපළ ද මායිම්ව එකී අංක 940 දරන පිඹුරට අනුව පර්චස් දාහතයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 17.5) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B373/127හි ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

එකී පමුණුව පිහිටි සුචරිතෝදය පාරේ, වරිපනම් අංක 43/17C දරන තුයියවත්ත හෙවත් මිල්ලගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු H. G. C. ඩයස් විස්තර සාදන ලද 1972 නොවැම්බර් 5 (නමුත් 1972 නොවැම්බර් මස 2 ලෙස ලියාපදිංචි කර ඇති) දිනැති අංක 940 දරන පිඹුරෙහි ලොට් B5 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් B5, ඊසානදිගට : ලොට් B6, B7 සහ B8 ද, ගිනිකොණට : පාර ද, නිරිතට : ලොට් B4, B3 හා B2 ද, වයඹට : ලොට් B1 ද මායිම්ව එකී අංක 940 දරන පිඹුරට අනුව පර්චස් නවයයි දශම දෙකක (අ. 0, රූ. 0, පර්. 9.2) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති සියලු දේ සමඟ වේ. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 412/57හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

W. M. H. A. S. S. B. ඒකනායක මහතා,
කළමනාකරු,
(අයකර ගැනීම් හා ණය සුපරීක්ෂණ)

2019 සැප්තැම්බර් මස 30 වැනි දින,
ලංකා බැංකුව,
අගනුවර ශාඛාව.

11 - 1692

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම**

2019.05.10 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඩබ්. එස්. බී. ඒකනායක විසින් සහතික කරන ලද 2014.08.01 දිනැති අංක 906 දරන උකස් බැඳුම්කරය මත 2018.07.29 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 6,194,205.48 (රුපියල් හැටඑක්ලක්ෂ අනූහතරදහස් දෙසියපහයි ශත හතලිස් අටක) මුදල සමඟ රුපියල් පනස්පන් ලක්ෂයක (රු. 5,500,000.00) මුදලක් මත වසරකට සියයට දාහත (17%) බැගින් 2018.07.30 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, මහනුවර, නාගස්තැන්න පාර, අංක 32/C හි පොත්තැවිල විදානලාගේ කරුණාරත්න මහතා හෙවත් පොත්තැවිල විදානලාගේ ජයනාත් කරුණාරත්න මහතා හෙවත් පොත්තැවිල විදානලාගේ කරුණාරත්න හෙවත් පොත්තවිල විදානලාගේ කරුණාරත්න සහ දිසානායක මුදලිගේ කාංචනා කුමාරි විජේසිංහ මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඩබ්. එස්. බී. ඒකනායක විසින් සහතික කරන ලද 2014.08.01 දිනැති අංක 906 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු (රු. 6,194,205.48) රුපියල් හැටඑක්ලක්ෂ අනූහතරදහස් දෙසියපහයි ශත හතලිස් අටක මුදල සමඟ 2018.07.30 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, කොළොන්නාව, විහාර මාවතේ, අංක 182/3 (50/3), ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වග වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, මහනුවර අධිශ්‍රේණි ශාඛාවේ, ප්‍රධාන කළමණාකරුහට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාවේ, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙයියන්නෙවෙල ග්‍රාමසේවා කොට්ඨාසයේ, හපුගස්පිටියෙහි පිහිටි "තිබ්බොට්ටුවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එල්. කේ. ජයසුන්දර විසින් සාදන ලද 1999.05.17 දිනැති අංක J1238 නිවැරදි ලෙස J1298 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල පර්චස් හතයි දශම බිංදුවයි දෙකක (අ. 0, රූ. 0, පර්.7.02) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, ඊසාන දිගට : නාගස්තැන්න පාර ද, ගිනිකොණට : ඩී. ගුණසේන නූර් මොහොමඩ් සවාහිර් සහ පී. ලෙවන්ගම උරුමකම් කියන ප්‍රවේශ මාර්ගය සඳහා වෙන් කළ කොටස ද, නිරිතට : ජමාල්දීන් උරුමකම් කින නාගස්තැන්න පාරේ, වරිපනම් අංක 32/5 දරන පරිශ්‍රය ද, වයඹට : අංක J1238 නිවැරදිව J1298 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා ඇති එම ඉඩමේ ඉතිරි කොටස ද මායිම්ව එහි ඇති සියලු දේ සමඟ වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 425/250හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. කේ. ගජනායක,
ප්‍රධාන කළමනාකරු,

ලංකා බැංකුව,
මහනුවර අධිශ්‍රේණි ශාඛාව.

11 - 1691

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2019.09.04 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් G. C. P. තිලකරත්න විසින් සහතික කරන ලද 2007.07.16 දිනැති අංක 3196 දරන උකස් බැඳුම්කරය ප්‍රසිද්ධ නොතාරිස් N. T. පතිනායක විසින් සහතික කරන ලද 2011.02.15 දිනැති අංක 1217 දරන උකස් බැඳුම්කරය ප්‍රසිද්ධ නොතාරිස් M. D. I. K. කරුණාරත්න විසින් සහතික කරන ලද 2015.05.15 දිනැති අංක 1176 දරන උකස් බැඳුම්කරය මත ණය මුදල (1) මත 2019.07.02 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් (රු. 1,706,895.23) රුපියල් දහහත් ලක්ෂ හය දහස් අටසිය අනූපහයි ශත විසිතුනක මුදලක් සමග (රු. 1,430,029.61) රුපියල් දාහතර ලක්ෂ තිස්දහස් විසි නවයයි ශත හැට එකක මුදලක් මත වසරකට සියයට හතර (4%) බැගින් 2019.07.03 දින සිට ගෙවීම නිමකරන තෙක් තවදුරටත් පොළිය ද, ණය මුදල (2) මත 2019.07.02 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් (රු. 3,782,977.80) රුපියල් තිස් හත් ලක්ෂ අසූ දෙදහස් නවසිය හැත්තෑ හතයි ශත අසූවක) මුදලක් සමග (රු. 3,340,000.00) රුපියල් තිස්තුන් ලක්ෂ හතලිස් දහසක මුදලක් මත වසරකට සියයට දහතුන (13%) බැගින් 2019.07.03 වැනි දින සිට ගෙවීම නිමකරන දිනය තෙක් තවදුරටත් පොළිය ද ණය මුදල (3) මත 2019.07.02 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් (රු. 4,437,566.71) රුපියල් හතලිස් හතර ලක්ෂ තිස්හත් දහස් පන්සිය හැට හයයි ශත හැත්තෑ එකක මුදලක් සමග (රු. 4,234,440.86) රුපියල් හතලිස් දෙලක්ෂ තිස් හතර දහස් හාරසිය හතලිහයි ශත අසූ හයක මුදලක් මත වසරකට සියයට දොළහ (12%) බැගින් 2019.07.03 වැනි දින සිට ගෙවීම නිමකරන තෙක් තවදුරටත් පොළිය ද, මිනුවන්ගොඩ, මීගමු පාර, අංක 23/1 හි පදිංචි ගනීහි අච්චි දොන් නිලුත් ඇන්ටන් රොෂාන් වර්ණකුලසූරිය මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී 2007.07.16 දිනැති අංක 3196 දරන උකස් බැඳුම්කරය 2011.02.15 දිනැති අංක 1217 දරන උකස් බැඳුම්කරය සහ 2015.05.15 දිනැති අංක 1176 දරන උකස් බැඳුම්කරය මත ණය මුදල (1) මත අයවිය යුතු (රු. 1,706,895.23) රුපියල් දහහත් ලක්ෂ හය දහස් අටයි අනූ පහයි ශත විසි තුනක මුදලක් ද ණය මුදල (2) මත අයවිය යුතු (රු. 3,782,977.80) රුපියල් තිස් හත්ලක්ෂ අසූදෙදහස් හැත්තෑ හතයි ශත අසූවක මුදලක් ද ණය මුදල (3) මත අයවිය යුතු රු. 4,437,566.71 (රුපියල් හතලිස් හතර ලක්ෂ තිස්හත් දහස් පන්සිය හැට හයයි ශත හැත්තෑ එකක) මුදලක් ද සමග 2019.07.03 දින සිට ගෙවීම නිමකරන දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි වියදම් හා මුදල්ද අයකර ගැනීම සඳහා ඉහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකරු තුසිත කරුණාරත්න මහතාට ද එකී ලංකා බැංකු ආඥා පනතේ 19 වන වගන්තිය (397 අධිකාරය) හා එහි සංශෝධන යටතේ ද ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ, මිනුවන්ගොඩ අධිශ්‍රේණි ශාඛාවේ, කළමනාකරුහට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ නගර සභා සීමාවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද මිනුවන්ගොඩ, අංක 125 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මීගමු පාර, වරිපනම් අංක 23/3 දරන බොරගොඩවත්ත හි පිහිටි අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු S. G. N. සඳහිරි විසින් සාදන ලද 2006 ජූලි 7 දිනැති අංක 1420 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 1, උතුරට : නගර සභා පාර සහ අංක 7872 දරන පිඹුරෙහි ලොට් 1 ද, නැගෙනහිරට : අංක 7872 දරන පිඹුරෙහි ලොට් 2 ද සහ අංක 1848 දරන පිඹුරෙහි ලොට් 6 ද, දකුණට : අංක 1848 දරන පිඹුරෙහි ලොට් 6 සහ ලොට් 2 ද, බස්නාහිරට : නගර සභා පාර ද මායිම්ව එකී අංක 1420 දරන පිඹුරට අනුව පර්චස් දහහතරයි දශම හතයි නවයක (අ. 0, රූ. 0, පර්. 14.79) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සමඟ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 258/86හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

P. V. P. ශාමලී මිය,
කළමනාකරු,

ලංකා බැංකුව,
මිනුවන්ගොඩ ශාඛාව.

11 - 1690

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 සැප්තැම්බර් මස 17 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව විශේෂයෙන් ම සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් බී. කේ. දිනූෂා බාලසූරිය මහත්මිය විසින් ඉහත කී නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එකී බැංකුව) නමින් සහතික කරන ලද අංක 269 සහ 2017.09.17 වැනි දින දරන උකස් බැඳුම්කරය මත ගෙවීම්, ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා හමුවේ ලියාපදිංචි කරන ලද (බස්නාහිර පළාතේ පළාත් සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ), සහතික අංක WY 8590 සහ 2015.03.03 වැනි දින දරන සිය ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය මිනුවන්ගොඩ පවත්වාගෙන යන, එකී "දිනූක ඇලුමිනියම් මාකටින්" යන නාමය විලාසය සහ අභිධානය යටතේ තනි හිමිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යන මිනුවන්ගොඩ ජයකොඩි ආරච්චිගේ අසාන් දිනූක ජයකොඩි යන අය (ණය ගැණුම්කරු) විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

එකී ණය ගැණුම්කරු විසින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රයේ ඔහුගේ සින්නක්කර අයිතිය, හිමිකම සහ භුක්තිය ඉහත කී අංක 269 දරන උකස් බැඳුම්කරය යටතේ එකී බැංකුව වෙත උකසට තබා ඇති බැවින් ද,

ඒ අනුව, ඉහත කී බැඳුම්කරය මත 2019 ජූලි මස 31 වැනි දිනට රුපියල් හැටහත්ලක්ෂ තුන්දහස් පන්සිය අසූහතකුත් ශත හතකි. (රු. 6,703,587.07) මුදලක් එකී බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද,

එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (මෙහි මින්මතු සාමූහික වශයෙන් එකී ප්‍රධාන පනත ලෙස හඳුන්වන) යටතේ එකී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියාකරමින් රුපියල් හැටහත්ලක්ෂ තුන්දහස් පන්සිය අසූහතකුත් ශත හතක (රු. 6,703,587.07) මුදල හෝ එකී දේපළ විකිණීමේ දිනය වන විට එයින් නොගෙවා ඉතිරිව තිබෙන යම් මුදලක් සහ ඊට අමතරව, ඉහත කී අංක 269 දරන බැඳුම්කරය මගින් ඇප තබන ලද සහ එකී අංක 269 දරන බැඳුම්කරය මත එකී බැංකුවට අයවිය යුතු රුපියල් හැට එක් ලක්ෂ පනස් දෙදහස් නවසිය හැත්තෑ අටකුත් ශත නවයක (රු. 6,152,978.09) මුදල මත 2019 අගෝස්තු මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක්, වර්ෂයකට සියයට විස්සයි දශම පහයි බින්දුව (20.50%) බැගින් පොළිය සහ තව ද, ප්‍රචාරණ වියදම් සහ දේපළ විකිණීමේ පිරිවැය සහ ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද වෙනත් ගාස්තු යනාදිය සහ තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී බැඳුම්කර මඟින් එකී බැංකුවට උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළයේ, දාසිය පත්තුවේ, කටුනායක - සීදූව නගරසභා සීමාව තුළ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කටුනායක ග්‍රාම නිලධාරි වසමේ කටුනායක ගමේ පිහිටි "ගොරකගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් මැන සාදන ලද අංක 4763 සහ 2011.11.16 වැනි දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ ලොට් 1 දරන බිම් කොටසට මායිම්,

උතුරට ඃ එම්. ඩී. මහේෂ් ඉන්දිකගේ ඉඩම ද, නැගෙනහිරට ඃ ගොරකගහවත්තේ කොටසක් ද, දකුණට ඃ ඒ. බර්තා ප්‍රනාන්දු සහ තවත් අයගේ ඉඩම් ද, බස්නාහිරට ඃ කේ. මිලානි ප්‍රනාන්දු යන අයගේ ඉඩම සහ අඩි 10ක් පළල පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහසයකුත් දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 16.15) විශාල බිම් කොටස සහ ඒ මත පිහිටි ඊට අයිති ගහකොළ, වැවිලි, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමඟ වන අතර මෙම දේපළ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 18/132 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද, එකී අංක 4763 දරන පිඹුරේ නිරූපිත ප්‍රධාන මාර්ගය දක්වා වැටී ඇති සියලු මාර්ග මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද, සමඟ ය.

තව ද, මෙහි ඉහත සවිස්තරව දැක්වෙන ඉඩමේ වර්තමානයේ තිබෙන හෝ මෙහි මින් මතු කලින් කලට සවිකරන හෝ ස්ථිරවම ඇඳනු ලබන සියලු සහ සෑම නිශ්චල පිරියත සහ යන්ත්‍රසූත්‍ර, උපකරණ, තිරවුරු, සවිකිරීම් සහ සේවාවන් සහ එමෙන් ම උපකරණ, විදුලි සැපයුම් පද්ධති, ජල සැපයුම් පද්ධති, උපකරණ, විදුලි සංදේශ සේවා, උපකරණ සහ වායු සමීකරණ උපකරණ ද සමඟය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

11 - 1655

**පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කළුබෝවිල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : චාමර පුංචිහේවා.

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2018.04.25 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, චාමර පුංචිහේවා උකස්කරු බන්ධනදායී වශයෙන් කලින් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.01.11 දිනැති අංක 4135 දරන ප්‍රාථමික චල උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 4135 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2018.04.02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය ද, වශයෙන් රුපියල් තුන් මිලියන අනූ හතර දහස් අටසිය තිස් හතරයි ශත තිස් හතක (රු. 3,094,834.37) මුදල සහ එකී මුදල ගෙවනු ලබන තෙක්, වර්ෂ 2018.04.03 වැනි දින සිට රු. 2,963,052.08ක මුදල මත වාර්ෂිකව 18% බැගින් පොළිය පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 4135 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් තුන් මිලියන අනූ හතර දහස් අටසිය තිස් හතරයි ශත තිස් හතක (රු. 3,094,834.37) මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත චාමර පුංචිහේවා විසින් උකස්කර ඇති දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

**උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම ප්‍රාදේශීය සභාවේ, හෙට්ටිවීදිය ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ සීමාවන් තුළ, හෙට්ටිවීදියේ පිහිටි, හෙට්ටිවීදිය පාරේ, වැලිගම ප්‍රාදේශීය සභාවේ, වරිපනම් අංක 66 දරන "අම්බලන්වත්ත" නමැති ඉඩමට, බලයලත් මිනින්දෝරු එච්. ඒ. එල්. එම්. හිෂාම් විසින් මැන සාදන ලද 2011.10.26 වැනි දිනැති අංක 2279 දරන පිඹුරට අනුව ලොට් අංක 01 දරන කැබැල්ල. (මෙය බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසන් මැන සාදන ලද 1996.03.28 දිනැති අංක 4931 දරන පිඹුරේ ලොට් 01 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු එච්. ඒ. එල්. එම්. හිෂාම් විසින් මැන සාදන ලද 2011.05.11 දිනැති අංක 2162 දරන පිඹුරට අනුව ලොට් 1A, 1B සහ 1C දරන යාබද කැබලි තුන ඒකාබද්ධ කරමින් කරන ලද නැවත මැනුමක් වේ.) එකී අංක 2279 දරන පිඹුරට අනුව ලොට් 1 දරන කැබැල්ල, උතුරට : ඇල ද, නැගෙනහිරට : හෙට්ටිවීදිය පාර ද, දකුණට : රාජකුලවර්ධන පාර ද, බස්නාහිරට : බිත්තිය ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් හතරයි දශම එකයි නමයක් (අ. 0, රූ. 0, පර්. 34.19) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත්ය. මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D/1010/293, D/1202/98 සහ D/1010/292 දරන පත්‍ඉරුවලට හරස් සටහන් සහිතව D/1204/173 දරන වෙළුමේ/පත්‍ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමනාකාරිණි - ණය අයකර ගැනීම්.

11 - 1673

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක - 2293234 සහ 2293258

ඉන්දික එරන්ද බණ්ඩාර ලියනගේ

2019 ඔක්තෝබර් මස 25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. ආර්. උදයංග විසින් 2016 සැප්තැම්බර් මස 13 වැනි දින සහතික කරන ලද අංක 98 සහ 2016 නොවැම්බර් 29 වන දින සහතික කරන ලද අංක 118 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම් ඉන්දික එරන්ද බණ්ඩාර ලියනගේ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් මිලියන විසි පහයි අට ලක්ෂ අසූ හත් දහස් හයසිය පනස් දෙකයි ශත හතලිස් හය (රු. 2,58,87,652.46) ක මුදලක් 2019 සැප්තැම්බර් මස 19 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන විසි පහයි අට ලක්ෂ අසූ හත් දහස් හයසිය පනස් දෙකයි ශත හතලිස් හය (රු. 2,58,87,652.46) ක මුදල අය කර ගැනීම සඳහා සහ 2019 සැප්තැම්බර් මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 2,33,01,600.00 ක මුදලක් මත වර්ෂයකට 15.5% බැගින් වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 98 සහ 118 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තාවූද මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### ඉහත සඳහන් උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නන්දර කෝරළේ සහ නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 23E ග්‍රාම නිළධාරි කොට්ඨාශය සහ අනුරාධපුර නගර සභා සීමා ඇතුලත අනුරාධපුරය, නව නගරය, අදියර II හි, බණ්ඩාරනායක මාවත - වරිපනම් අංක 270 දරන ස්ථානයේ පිහිටි " වන්නියන්කුලමකැළේ" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්.බී. රත්නසිරි විසින් 2016.06.20 වැනි දින පිළියෙල කරන ලද අංක 7657 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : F. U. P. අ 3 හි ලොට් 2732 මගින් ද, නැගෙනහිරට : F. U. P. අ 3 හි ලොට් 2729 මගින් ද, දකුණට : F. U. P. අ 3 හි ලොට් 2731 මගින් ද, සහ බස්නාහිරට : F. U. P. අ 3 හි ලොට් 2727, මගින් ද මායිම් වූ එකී අංක. 7657 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තුනයි දශම තුනයි හය (අ.0. රූ.0 පර්.3.36) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

එකී ඉඩම නැවත මැනීමක් පහත විස්තර කරන ලද ඉඩමෙන් වේ.

ඉහත කී අනුරාධපුරය, නව නගරය, අදියර II හි, බණ්ඩාරනායක මාවත - වරිපනම් අංක 270 දරන ස්ථානයේ පිහිටි "වන්නියන්කුලමකැළේ" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. බී. ආරියසේන විසින් 1993/05/10 වන දින පිළියෙල කරන ලද අංක 27/93 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : F. U. P. අ 3 හි ලොට් 2732 මගින් ද, නැගෙනහිරට : F. U. P. අ 3 හි ලොට් 2729 මගින් ද, දකුණට : F. U. P. අ 3 හි ලොට් 2731 මගින් ද, සහ බස්නාහිරට : F. U. P. අ 3 හි ලොට් 2727, මගින් ද මායිම් වූ එකී අංක. 7657 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තුනයි දශම තුනයි හය (අ.0. රූ.0 පර්.3.36) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වන මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව D 18/29 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2019 නොවැම්බර් මස 17 වැනි දින,

11 - 1638

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක - 1900957.

සිටි කන්ස්ට්‍රක්සන් ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ්.

2018 ජූනි මස 29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2011 මැයි මස 10 වැනි දින සහතික කරන ලද අංක 4330, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එල්. ජයවීර විසින් 2012 පෙබරවාරි මස 08 වැනි දින සහතික කරන ලද අංක 3514 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. එම්. එන්. රාජසූරිය විසින් 2018 ජනවාරි මස 26 වැනි දින සහතික කරන ලද අංක 2424 දරන දරණ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම් ශ්‍රී ලංකාවේ නිත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වන පිටකෝට්ටේ, පාගොඩ ආනන්ද බාලිකා මාවතේ අංක 07 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි සිටි කන්ස්ට්‍රක්සන් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙසද ඉලන්දාරි දේවගේ විජේරත්න

උකස්කරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් එක්කෝටි දහඅට ලක්ෂ හතලිස් හත්දහස් නවසිය අසූතුනයි ශත පනස් හතරක (රු. 1,18,47,983.54) ක මුදලක් 2018 මැයි මස 18 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්ද එකී රුපියල් එක්කෝටි දහඅට ලක්ෂ හතලිස් හත්දස් නවසිය අසූතුනයි ශත පනස් හතරක මුදල (රු. 1,18,47,983.54) ක මුදල අය කර ගැනීම සඳහා සහ 2018 මැයි මස 19 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,13,51,000 ක මුදල 14% වැඩිදුර වාර්ෂික පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩු කොට එකී අංක 4330, 3514 සහ 2424 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තාවූද මෙහි උපලේඛණයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 හි, පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ගොඩිගමුව දකුණ 532B ග්‍රාම නිළධාරි කොට්ඨාශයේ, ගොඩිගමුව ගමෙහි පිහිටි නල්ලවත්ත පාරේ - වරිපනම් අංක 21/1 හි පිහිටි "බටදොඹගාවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් 1995 ජූලි මස 06 වැනි දින මැන සාදන ලද අංක 995 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 3A2 වශයෙන් දක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් 3A1 සහ අඩි 20 පළල පාරෙන්ද (පිඹුරු අංක 909 හි ලොට් 1A), නැගෙනහිරට : අඩි 20 ක් පළල පාරෙන්ද (පිඹුරු අංක 909 හි ලොට් 1A) සහ නල්ලවත්ත පාරේ වරිපනම් අංක 19 න් ද, දකුණට : වරිපනම් අංක 19 සහ නල්ලවත්ත පාරේ 25/1 න් ද, සහ බස්නාහිරට : නල්ලවත්ත පාරේ වර්පනම් අංක 25/1 න් සහ ලොට් 3A1 න්ද මායිම් වූ එකී අංක 995 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හතයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 7.25) හෝ හෙක්ටයාර් 0.0183 ක විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම, ගොඩනැගිලි, පස, සහ එහි පිහිටි සියළු දේත් සමග වේ. වන මෙය දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව M2113/24 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් මාර්ග වෙන් කිරීම උඩින් හා ඔස්සේ ගමන් කිරීමේ අයිතියද සමග වේ.

ඉහත සඳහන් ගොඩිගමුව ගමෙහි පිහිටි "බටදොඹගාවත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් 1994 මාර්තු මස 01 වන දින මැන සාදන ලද අංක 909 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1A(අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කර ඇති කොටස) ට මායිම් වශයෙන් දක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : නල්ලවත්ත පාරෙන්ද, නැගෙනහිරට : නල්ලවත්ත පාරේ වරිපනම් අංක 17 න් සහ ලොට් 1B (නල්ලවත්ත පාරේ වරිපනම් අංක 19), දකුණට : ලොට් 1B (නල්ලවත්ත පාරේ වරිපනම් අංක 19) සහ නල්ලවත්ත පාරේ වරිපනම් අංක 21/1 සහ 21 න් ද, සහ බස්නාහිරට : නල්ලවත්ත පාරේ වරිපනම් අංක 21/1 න් සහ 21 න් ද මායම් වූ එකී අංක 909 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහතුනයි දශම නවයයි තුනක් (අ. 0. රූ. 0 පර්. 13.93) විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම ගොඩනැගිලි, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ. වන මෙය දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව 1988/249 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනි ගමගේ මිය,
සමාගම් ලේකම්.

11 - 1639

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.